දිල්හානී, අනුරුද්ධිකා
PAPER

**වතුවගාව මුල් කරගෙන 19 හා 20 වන සියවස් තුල බිහි වු වාණිජ සංවිධානවල ව්‍යුහය හා ක්‍රියාකාරීත්වය පිළිබඳ විමර්ශනයක්**

**අනුරුද්ධිකා දිල්හානී, ඉතිහාසය අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය.**

බ්‍රිතාන්‍ය පාලන යුගයේදී වතු වගාව ආරම්භ වීමත් සමඟ මෙරට තුළ වැවිලිකරුවන් හා වෙළඳුන් වශයෙන් වෙනම ක්‍රියාකාරී සමාජ පංතියක් බිහි විය. මෙම සමාජ පංතිය ප්‍රධාන වශයෙන් සැදුම් ලද්දේ යුරෝපීය ජාතිකයන් හා ලංකාවේ පහතරට ප්‍රදේශවල ජනතාවගෙනි. ලංකාවේ අර්ථ ක්‍රමය තුළ මූලිකත්වය ගත්තේ යුරෝපීය හා වාණිජ සමාගම් වු අතර පොල් හා මිනිරන් නිෂ්පාදන දේශීය ධනපති පංතිය මත රදා පැවතුණි. යුරෝපීය ව්‍යවසායකයන් හා ලාංකීය ධනවත් පංතිය තම නිෂ්පාදන කටයුතුවලදී ආයාත -.- නිර්යාත වෙළඳපොල සම්බන්ධයෙන් බොහෝ ගැටලුවලට මුහුණ පෑමට සිදු විය. වතු ආර්ථිකය තුලින් බිහිවු වාණිජ මණ්ඩල හා යුරෝපීය ව්‍යවසායක සංගම් තිබුණත් ඒවා තුලින් ඔවුන්ගේ අවශ්‍යතා සපුරා ගැනීමට තරම් ශක්තියක් නොලැබුණි. මේ නිසා යුරෝපීය වතුවගාකරුවන්ගේ ලංකා වැවිලි සංගමය ꞉Ceylon Planters' Association* හා ලංකා වාණිජ මණ්ඩලය ꞉Ceylon Chamber of Commerce* වැනි සංගම් ආදර්ශයට ගනිමින් ලාංකික ධනපති පංතිය තුළින් ද විවිධ වාණිජ සංවිධාන බිහි විය. ලංකා කෘෂිකාර්මික සංවිධානය, පහත රට නිෂ්පාදන සංවිධානය, හලාවත සංවිධානය, යාපන සංවිධානය වැනි සංවිධාන ඉන් ප්‍රධාන තැනක් ගත් ඒවාය.

1882දී ලංකා කෘෂිකාර්මික සංවිධානය පිහිටවු අතර එහි පුරෝගාමියා වුයේ සී.එච්. ද සොයිසා ය. එය පිහිටුවීමේ අරමුණ වූයේ දේශිය කුරුඳු වගාකරුවන් මුහුණ දී තිබු ගැටලුවලට හා ඔවුන්ගේ ආර්ථික අවශ්‍යතාවලට මැදිහත් වීමයි. ලාංකීය විශාල පිරිසක් මේ සංවිධානය වටා ඒකරාශි වු අතර 1888 පමණ වන විට ආර්ථික අරමුණුවලින් ඔබ්බට ගොස් දේශපාලන ප්‍රශ්න සම්බන්ධයෙන් මුල්ව ක්‍රියාකරන්නට විය. මේ සංවිධානවල සිටි ක්‍රියාශිලි තරුණ පිරිස් එකතුවී ලංකා කාර්මික සංවිධානය යන නාමය 1888දී ලංකා ජාතික සංගමය යනුවෙන් වෙනස් කරමින් දේශපාලනය ව්‍යාපාරයට සම්බන්ධ විය.

ලාංකික ඉඩම් හිමියන්ගේ අවශ්‍යතා සපුරාලීම හා තම වෙළඳම සම්බන්ධයෙන් පැන නගින ගැටලු විසඳීම අරමුණු කොටගෙන 1907දී පහතරට නිෂ්පාදන සංවිධානය පිහිටුවීය. 19 වන සියවස දෙවන භාගය වන විට විශාල පොල් ඉඩම් හිමි දේශීය ධනේෂ්වර පංතියක් සිටි අතර සී.එච්. ද සොයිසා, ජේම්ස් අල්විස්, එම්.ඒ ප්‍රනාන්දු, හෙන්ද්‍රික් කොරයා ප්‍රධාන තැනක් ගත් පොල් ඉඩම් හිමි පුද්ගලයෝය. හලාවත සංවිධානය ද ඉඩම්හිමි ධනේෂ්වර පංතික කොරයා පවුලේ මූලිකත්වයෙන් ආරම්භ වුවකි.

ප්‍රාථමික හා ද්විතියික මූලාශ්‍රය පරිශීලනය කරමින්, ආර්ථික පරමාර්ථ මූලික කර ගනිමින් බිහි වු මෙම සංවිධානවල ව්‍යුහය හා ක්‍රියාකාරීත්වය කෙබඳු ද යන්න සොයා බැලීම මෙම පර්යේෂණය තුළින් අපේක්ෂා කෙරේ.

එකී සංවිධාන ආරම්භ වන්නේ පහතරට ලාංකීය ධනපති පංතිය මඟිනි. 1882 දී කුරුඳු වෙළන්දන්ගේ අවශ්‍යතා සපුරාලීම සඳහා පිහිටු වූ ලංකා කෘෂිකාර්මික සංගමය 1888 දී ලංකා ජාතික සංගමය යනුවෙන් වෙනස් වූ අතර මෙතැන් පටන් සමාජමය ප්‍රශ්න මුල්කරගෙන දේශපාලන මුහුණුවරක් ගත්තේය. මුල් කාලයේදී මේ සංවිධාන ආර්ථික පරමාර්ථ මුල් කරගෙන සිය අයිතිවාසිකම් දිනා ගැනීම උදෙසා බිහිවුවත් පසුකාලය වන විට ඒතුලින් දේශපාලන අරමුණු ද ඉස්මතු වු බව පෙනේ. විශේෂයෙන් ම විසිවන සියවස දෙවන භාගය පමණ වන විට මෙම වාණිජ සංවිධාන ආර්ථික පරමාර්ථවලින් ඔබ්බට ගොස් ජාතික නිදහසක් කරා යන ගමනේදී දේශපාලනික වශයෙන් ප්‍රබල දායකත්වයක් සැපයු බව පෙනේ.